**කැන්විල් හෝල්ඩින් (පුද්ගලික) සමාගම - 2022**
**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

කැන්විල් හෝල්ඩින් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2022 දෙසැම්බර් 31 දිනට, සමාගමේ සහ පරිපාලිතයන්හි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**අවධාරණය කරණු ලබන කරුණ**

මගේ මතයට බලපෑමක් සිදු නොකර, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය, මූල්‍ය ප්‍රකාශන වල 2.5 සටහන වෙත අවධානය යොමු කරමි.
එම සටහනේ දක්වා ඇති පරිදි, සමාගමේ කළමනාකාරීත්වය සමාගමට සහ එහි අනුබද්ධිත සමාගම්වල අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි නුදුරු අනාගතයේ දී ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත් වේ. තවද සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් කළමනාකාරීත්වය හඳුනාගෙන නැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

කෙසේ වෙතත් හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 වර්ෂයේ දී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ හෝටල් ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත. අපේක්ෂා කරන ලද ඉදිරි අනාගතයේදී සමාගම ඇවර කිරීමට තීරණය කර නොමැති අතරම ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරීත්වය රේඛීය අමාත්‍යාංශයෙන් උපදෙස් අපේක්ෂා කරනු ඇත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

තවද සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ හි කළමනාකාරීත්වය සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර නුදුරු අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍යය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත් වේ. තවද, සමාගමට අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණය හඳුනාගෙන නැත. මීට අමතරව, 2020 ජූලි 10 දිනැති අංක 20/1042/204/050-I අමාත්‍ය මණ්ඩල ප්‍රතිකාව මඟින් ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතියේ ඉදිරිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත. කෙසේ නමුත්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2022 මැයි 30 දින සිට බලපැවැත්වෙන පරිදි, මාස නවයක කාලපරිච්ඡේදයක් සඳහා පරිමාණය අඩු කිරීමක් සහිතව ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට නිශ්චය කර තිබුණු අතර වාර්තා කරන දින වන විටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.

තවද, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන කැබිනට් තීරණය ප්‍රකාරව, කැබිනට් අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සතු කොටස් හා කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට (මව් සමාගම) අයත් ලිට්රෝ ගෑස් ලංකා සමාගම සතු කොටස්, වහාම ක්‍රියාත්මක වන පරිදි මහා භාණ්ඩාගාරය වෙත පවරාදීමට අනුමත කර තිබුණි.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණනය විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා

වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්මඅවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම සම්බන්ධ සියලුම ගැටළු මෙම මාතෘකාව යටතේ පෙන්වනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 52 (3) වගන්තිය | කොටසක් රු. 8.50 බැගින් වූ කොටස් 235,294,117 ක් ප්‍රතිශ්‍යාව ලැබීමකින් තොරව නිකුත් කර ඇති අතර එම කොටස් නිකුත් කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ගොනු කර ඇත. කෙසේ වෙතත්, **මූල්‍ය ප්‍රකාශන** ඒ අනුව ගැලපීම් සිදු කර නොතිබුණි. එබැවින් සමාගමේ **මූල්‍ය ප්‍රකාශන** වල පෙන්වා ඇති කොටස් ප්‍රාග්ධනය සහ සමාගම් රෙජිස්ටාර්වරයාගේ වාර්තා අතර රුපියල් බිලියන 2 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රධාන කොටස් හිමියා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කරන ලද ඉල්ලීම මත මෙම සාමාන්‍ය කොටස් නිකුතුව අවලංගු කිරීමට තීරණය කර ඇති අතර EPF හැර ගෝල්ඩන් කොටස් හිමියන් ඇතුළු අනෙකුත් සියලුම කොටස් හිමියන් 2021 ජුනි 10 දින නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් අවලංගු කිරීමට එකඟ වී ඇත.<br>අපි භාණ්ඩාගාර ලේකම්වරයා සමඟ මෙම තත්ත්වය නිවැරදි කිරීම පිළිබඳ කාරණය අවසන් කළද, සේවක අර්ථසාධක අරමුදල එකඟ නොවීම හේතුවෙන් මෙම කාරණය නොවිසඳී ඇත. | සමාගම් පනතේ වගන්තිවලට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,299,299 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 5,008,966 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,308,265 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මූල්‍ය ආදායමේ අඩු වීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වසර පහ තුළ ආදායම්, පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභය/ අලාභය පහත පරිදි විය.

| වර්ෂය | 2022<br>රු. | 2021<br>රු. | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|---|---|
| මූල්‍ය ආදායම | 1,627,095 | 16,009,682 | 1,225,668 | 9,435,080 | 25,564,060 |
| පරිපාලන වියදම් | (7,753,562) | (9,411,210) | (6,540,697) | (9,931,740) | (8,725,269) |
| බදු පසු ශුද්ධ ලාභය/(අලාභය) | (4,299,299) | 5,008,966 | (4,076,470) | (255,178) | 18,477,650 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාතය | 2022 | 2021 | 2020 | 2019 | 2018 |
|---|---|---|---|---|---|
| මූල්‍ය ආදායමේ වැඩි වීම /(අඩුවීම) | (90)% | 1206% | 87% | (63)% | (33)% |
| පරිපාලන වියදම් වැඩි වීම/(අඩු වීම) | (18)% | 44% | 34% | 14% | 11% |
| ශුද්ධ ලාභය වැඩි වීම/(අඩු වීම) | (186)% | (223)% | 1498% | (101)% | (89)% |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්මක් සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ මෙහෙයුම ආරම්භ වූ පසු හෝ මෙහෙයුම ආරම්භ කිරීමට මාස හයකට පෙරය. ඉදිකිරීම් කාලය තුළ සංයුක්ත සැලැස්මක් පිලියෙල කිරීම අදාළ නොවේ. | සමාගම සිය උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | මෙය ඉදිකිරීම් ව්‍යාපෘතියක් බැවින් වාර්ෂික සැලැස්මක් සකස් කර නොතිබුණද 2021 වර්ෂයේදී විස්තරාත්මක ව්‍යාපෘති සැලැස්මක් මුදල් අමාත්‍යාංශයට (ජාතික ප්‍රසම්පාදන කමිටුවට) ඉදිරිපත් කර ඇති අතර 2021 සහ 2022 සඳහා සකස් කරන ලද අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | සමාගම විසින් වසර ආරම්භයේදීම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමැතිය ලබාගෙන එහි වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය. |